# ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ '' ප්‍රාථමික ශිල්පීය නොවන '' සේවා ගණයට අයත් සහයක අරක්කැමි (පුරප්පාඩු 08), කාර්යාල කාර්ය සහයක (පුරප්පාඩු 07) හා සනීපාරක්ෂක කම්කරු (පුරප්පාඩු 04) යන තනතුරු පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති පරිදි සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**1. පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත

**2. වැටුප් ක්‍රමය**

**2.1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**
**2025.01.01** දින සිට
**PL 1** රු. 40,500 **- 10 x** 450 **- 10 x** 490 **- 7 x** 540 **- 15 x** 590 **-** 62,530

**3. සුදුසුකම්**

**3.1 බාහිර අයදුම්කරුවන් :-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

**3.2 වයස :-**

අවු : 18 ට නො අඩු හා අවු : 45 ට නො වැඩි අය විය යුතුය.

**3.3 වෙනත් :-**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතු ය.

## 4. බඳවාගැනීමේ ක්‍රමය:-

ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අයදුම්පත් කැඳවීමෙන් පසුව පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලබන අතර, පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ආකාරය පහත පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු 20 |
| අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | ලකුණු 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන ලද කාර්යය සාධනය | ලකුණු 60 |
| | ----- |
| මුළු ලකුණු ගණන | 100 |
| | === |

හුදෙක් ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුව කුසලතා අනුපිළිවෙලින් අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

### 4.1 සුදුසුකම් ලබන දිනය

තනතුරට පත් කිරීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 3.1, 3.2 හා 3.3 වන වගන්තිවල සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

### 4.2 ස්ථිර කිරීම

තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලබන සේවකයකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී තනතුරේ ස්ථිර කරනු ලැබේ.

### 4.3 බඳවා ගැනීමේ දී වැටුප

තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ.

5. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. ඔබගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත ලේඛණ ඉදිරිපත් කළ යුතු ය.

i. වලංගු ජාතික හැඳුනුම්පත, හෝ
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

6. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් විධායක අධ්‍යක්ෂ, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය, තිඹිරිගස්කටුව, මීගමුව යන ලිපිනය වෙත 2026.05.29 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙහි දැක් වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක මුද්‍රණය කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iii. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතීඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

iv. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

7. සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**8.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**9.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධරයා විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

**විධායක අධ්‍යක්ෂ**

ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

දිවුලපිටිය පාර

තිඹිරිගස්කටුව

මීගමුව

2026 මැයි මස 03 වන දින